# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/17 – 2018 ජනවාරි 09 වැනි අඟහරුවාදා – 2018.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක්කෝරළේ සුළු කොට්ඨාසයේ, මොරවක ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/කේට්පී/2017/439 හා 2017.09.18 දරණ ප්‍රගමණ අනුරේඛණයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්: 0.2023 ක් වන අක්ෂර 'ඒ' වශයෙන් දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – බොකටුගහහේන – ප්‍රමාණය: හෙක්. 0.2023**

උතුරට: රාමස්වාමී රාණි හිමිකම් කියන බොකටුගහහේන සහ රිදියගමගේ නන්දාවතී හිමිකම් කියන බොකටුගහහේන; නැගෙනහිරට: රිදියගමගේ නන්දාවතී හිමිකම් කියන බොකටුගහහේන සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ෆෙයරිමවුන්ට් තේ කර්මාන්ත ශාලාව හිමිකම් කියන බොකටුගහහේන; බටහිරට: ෆෙයරිමවුන්ට් තේ කර්මාන්ත ශාලාව හිමිකම් කියන බොකටුගහහේන සහ රාමස්වාමී රාණි හිමිකම් කියන බොකටුගහහේන.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/වීඊ/271.
2017 දෙසැම්බර් මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 659

1A – G26914 – 22 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*